ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

නො.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகறீஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2684051
ඊමේල් / ஈ-மெயில் / E-mail } Landoom@sltnet.lk

මගේ අංකය / எனது இல / MY NO } 3/සං/4/දේ.ආ.නි.
ඔබේ අංකය / உமது இல / YOUR NO }
දිනය / திகதி / DATE } 2007.11.07

චක්‍රලේඛ අංකය : 2007/05

(9)

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත,

**' අපි වවමු - රට නගමු**

**දේශිය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007 - 2010**

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදාදී බලපත්‍ර මත ඇති ඉඩම් සංවර්ධනය කිරීම**

---

'අපි වවමු - රට නගමු ' දේශිය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුමට අදාළව ජනාධිපති ලේකම් විසින් 2007.10.02 දින එවා ඇති උපදෙස් ලිපියට ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

02. දේශිය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ කටයුතු වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුල ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදාදී ඇති ඉඩම්, හැකිතාක් දුරට යොදා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජීවන් කුමාරණතුංග මැතිතුමාගේ අවධානය යොමුවී ඇත. දැනටමත් ශ්‍රී ලංකාව පුරා බලපත්‍රයක් පමණක් නිකුත් කර ඇති ඉඩම් කැබලි 140000 කට ආසන්න ප්‍රමාණයක් ඇති අතර එම ඉඩම් සංවර්ධනය කරන තුරු දීමනාපත්‍ර නිකුත් කිරීමේ කටයුතු කළ නොහැකි බැවින් මෙම ඉඩම් ඉහත සඳහන් වැඩසටහනට සම්බන්ධ කරගෙන දේශිය ආහාර නිෂ්පාදන වැඩසටහන දිරි ගැන්වීමට යොදා ගත යුතුව ඇත. මෙයින් ඇතැම් ඉඩම් නේවාසික කටයුතු සඳහා ලබාදී ඇති බැවින් ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 4 වන ඡේදයේ 1 යටතේ දක්වා ඇති ගෙවතු සංවර්ධන වැඩසටහනට යොමු කර ගැනීම අවශ්‍යය. කෘෂිකාර්මික කටයුතු සඳහා බෙදාදී ඇති සියළු ඉඩම් අත්‍යාවශ්‍ය ආහාර භෝග නිෂ්පාදනයට යෙදවීමටත් කටයුතු කළ යුතුව ඇත. එබැවින් බලපත්‍රලාභී ගොවි ජනතාව ඉහත අරමුණ කරා මෙහෙයවීමට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය යොදවා ගැනීමටත්, පළාත් ඉඩම් කොමසාරිස්ගේ උපදෙස් ලබා ගෙන එම ආයතනවල සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් යොදවා ගැනීමටත් කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

...........02),